**ශීර්ෂ 181- ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| **ශිර්ෂ** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 328 | මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය හා මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| **ශීර්ෂ** | **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය** |
|---|---|---|
| 181 | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 2015.07.16 |
| 328 | මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | 2015.07.16 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු රු.මිලියන 804.31 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 741.71 ක් උපයෝජනය කර තිබීමෙන් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.මිලියන 61.38 ක් හා රු. මිලියන 1.22ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11.57 ක් හා සියයට 0.44 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ශීර්ෂ** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 181 | 530.34 | 468.96 | 61.38 | 11.57 |
| 328 | 273.97 | 272.75 | 1.22 | 0.44 |
| **එකතුව** | **804.31** | **741.71** | **62.60** | **7.78** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන |
| 181 | 7.5 | 5.8 | 1.3 | 3.2 | 28.0 | 15.6 |
| 328 | 16.0 | 10.5 | 8.5 | 12.9 | 48.0 | 41.2 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 5.97 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0181/000 | 5.90 |
| මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | 6000/0000/00/0011/0185/000 | 0.07 |
| **එකතුව** | | **5.97** |

## 2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවල

ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

## 3. ශීර්ෂ 181 - ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය

### 3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (ඈ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

### 3.2 විසර්ජන ගිණුම

#### 3.2.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයකට සළසා තිබුණු රු.40,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 11 කට රු.10,526,703 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 85 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 3.3.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණු අතර රු.මිලියන 54 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 40 ක ප්‍රතිපාදන අමාත්‍යාංශයෙන් කිසිදු ඉල්ලීමකින් තොරව සංශෝධිත අයවැය ඇස්තමේන්තුව මගින් ලබා දී තිබුණු බව 2015 ජුලි 23 දින රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විගණනයට දන්වා තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අමාත්‍යාංශයට අයත් මෝටර් රථයක් 2013 ඔක්තෝබර් 15 දින අනතුරට පත්වීමෙන් රු.මිලියන 7.5 ක පමණ අලාභයක් සිදුවී තිබුණ අතර අදාළ අනතුර සිදු වී අවුරුදු 01 මාස 07 ක් ගත වී තිබුණත් විගණන දිනය වූ 2015 මැයි 18 දින වන විටත් රක්ෂණ වන්දි ලබා ගැනීමට හෝ වගකිවයුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට හෝ රථය අළුත්වැඩියා කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම

විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශය සතු වාහන සම්බන්ධ සමීක්ෂණ වාර්තා 2015 මැයි 18 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2014 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු භාණ්ඩ වර්ග 07ක ඌනතා හා අපහරණය සඳහා නිර්දේශ කළ භාණ්ඩ වර්ග 27 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**3.5 කාර්යසාධනය**
-----------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**
------------------------------------------------------

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ .

(i) පුද්ගලික අංශයේ ඵලදායිතාවය ප්‍රවර්ධනය සඳහා ගම්පහ, කළුතර, මාතර, මහනුවර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල පැවැත්වීමට සැලැසුම් කළ ‘‘කයිසන්’’ වැඩසටහන් 300 න් 128 ක් හෙවත් සියයට 43 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) නිලධාරීන්ගේ කුසලතා වර්ධනයට කෙටිකාලීන පුහුණු පාඨමාලා 25 කින් නිලධාරීන් 1000 කගේ කුසලතා වර්ධනය ඉලක්ක කර තිබුණද, ඉන් වැඩ සටහන් 9 කින් නිලධාරීන් 251 කගේ කුසලතා වර්ධනය කිරීමට නොහැකි වී තිබුණි. එම ඉටු නොකිරීමේ ප්‍රතිශතයන් පිළිවෙලින් සියයට 36 ක් සහ සියයට 25 ක් විය.

(iii) ඵලදායිතා ප්‍රවර්ධනය සඳහා ජාතික දැනුම කලමනාකරණ තරගාවලි සහ සම්මන්ත්‍රණ පවත්වා ත්‍යාග ප්‍රදානෝත්සවයක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණද එය ඉටුකර නොතිබුණි.

(iv) වර්ෂය තුළ ‘‘සඵල’’ සඟරා කලාප 6 ක් ප්‍රකාශයට පත්කිරීමට ඉලක්ක කර තිබුණද එයින් සියයට 83 ක් හෙවත් කලාප 5 ක් ප්‍රකාශයට පත්කර නොතිබුණි.

(v) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කළ ඵලදායිතා සංවර්ධන

නිලධාරින්ගේ 2014 වර්ෂයේ ප්‍රගතිය පරික්ෂා කිරිමට දිස්ත්‍රික්ක 18 ක ප්‍රගති වාර්තා සරාංශ විගණනයට ඉදිරිපත් කර තිබු අතර එක් එක් නිලධාරියාට ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට ලබා දුන් ඉලක්ක වෙත එම නිලධාරීන් ළඟා නොවූ අවස්ථා 1347 ක් තිබුණි.

## 3.6 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

2012/2013 වර්ෂයේ ඵලදායිතා සම්මාන උළෙලට රු.මිලියන 16 ක ප්‍රතිපාදන සළසා තිබුණද ඊට අයවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබු අතර අදාල කාර්යභාරය සතුටුදායක ලෙස ඉටුකළ බවට සහතිකයක් නොමැතිව අදාල උළෙල සංවිධානය කළ ආයතනයට රු.9,472,502 ක් ගෙවා තිබුණි. අදාල ක්‍රියාකාරකම් 48 ක් ඉටු කිරිම පිළිබඳව පසු විපරම් කර තිබුණු බවට සාක්ෂි නොතිබුණි.

### (ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

ජාතික ඵලදායිතා සම්මාන උළෙලේ කටයුතු ඉටු කළ ආයතනය සමඟ 2014 අගෝස්තු 18 දින ඇතිකර ගත් ගිවිසුමේ 20 (iv) ඡේදය අනුව සේවා සැපයුම්කරු විසින් අනුමත කොන්ත්‍රාත් කාර්යන්ට අමතරව සිදුකරන කාර්යන් ඉටුකිරීමට පෙර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එකග වූ වටිනාකමට වඩා රු.1,665,941ක් ගෙවීම් කිරීමට පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3.7 අනාර්ථික ගනුදෙනු

2013 නොවැම්බර් 18 දින ජාතික පුවත්පත් දෙකක ජනපති පදවි ප්‍රාප්තිය වෙනුවෙන් සුභාශිංෂන පළ කිරීමට ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් පුවත්පත් ආයතනයකට රු.347,200 ක් ගෙවා තිබීම අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය විය.

## 3.8 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කළ ඵලදායිතා සංවර්ධන නිලධාරීන් 590 දෙනෙකුගේ පැමිණීම, පිටවීම, නිවාඩු ලබා ගැනීම සහ පවරා ඇති කාර්යයන් නිසිලෙස ඉටුකර ඇති බව තහවුරු කර ගැනීමකින් තොරව එම නිලධාරීන්ට වැටුප්, වැටුප් වර්ධක, දීමනා හා ගමන් වියදම් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කළ මෙම නිලධාරීන්ගේ ක්ෂේත්‍ර රාජකාරිවල ප්‍රගති වාර්තා අමාත්‍යාංශයට එවනු ලැබුවද, එම වාර්තාවල සත්‍ය අසත්‍යතාවය භෞතිකව පරීක්ෂාවට ලක් කර නොතිබුණි. කෙසේ වෙතත් භෞතිකව පරීක්ෂා කිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික්කය පදනම් කරගෙන 2015 ජනවාරි 02 දින ආරම්භ කළ නියමු අධීක්ෂණ වැඩසටහන 2015 මැයි 18 දිනටත් අවසන් කර නොතිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 10 | 14 |
| (ii) | තෘතියික මට්ටම | 2 | - | 2 |
| (iii) | ද්විතියික මට්ටම | 799 | 657 | 142 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 10 | 14 |
| | **එකතුව** | **849** | **677** | **172** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 172ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## 4. ශීර්ෂ 328 - මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව

### 4.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** | **නිරීක්ෂණ** |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය. | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි |
| (ඈ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| (ඉ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 | පවත්වා නොතිබුණි. |
| (ඊ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | පවත්වා නොතිබුණි. |
| (උ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඌ) | ලංසු කැදවීමේ ලේඛන | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

**4.2 විසර්ජන ගිණුම**

**4.2.1 අයවැය විචලනය**

වැය විෂයයන් 02 කට රු.488,671.44 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 ක් හා සියයට 32 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**4.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 32801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු රු.301,114 ක ශේෂ වර්ෂ 1ක සිට වර්ෂ 3 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

**4.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දිනටත් පිළියෙල කර නොතිබුණි.

**4.5 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් පිළිබඳව සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව පැවති කාලය වසර | ඌන උපයෝජිතව පැවති කාලය වසර |
|---|---|---|---|---|
| (i) | මෝටර් වාහන | 01 | _ | 02 |
| (ii) | වෙනත් වත්කම් | 182 | 04 | _ |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, වාහන පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් පවත්වා එම වාර්තා 2015 මැයි 18 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2014 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දුන් අතිරික්තතා, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**4.6 අනුකූල නොවීම්**

**------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය. | • 2014 ජනවාරි මාසයේ සිට 2015 අප්‍රේල් මාසය දක්වා ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් 102 කුගේ නිවාඩු දින 1145ක් නිවාඩු ලේඛනයේ 2015 මැයි 18 දින වන විටත් ඇතුළත් කර නොතිබුණි.<br>• දිවයින පුරා පිහිටි දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු මානව සම්පත් සංවර්ධන නිලධාරීන්, |

| | |
|---|---|
| | ව්‍යාපෘති නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගේ පැමිණීම, පිටවීම හා නිවාඩු සම්බන්ධයෙන් සියළුම පරිපාලන කටයුතු දිස්ත්‍රික්/ප්‍රාදේශිය ලේකම්වරු වෙත පවරා තිබුණු අතර ආයතන 292 කින් 2015 මැයි 20 දින වන විට නිවාඩු වාර්තා දෙපාර්තමේන්තුවට ලැබී නොතිබුණු අතර නිවාඩු ලේඛනද යාවත්කාලීන කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය. | 2014 ජනවාරි 24 දින සිට අක්‍රියව තිබුණු දෙපාර්තමේන්තුවේ ඇඟිලි සලකුණු යන්ත්‍රය මාස 10 කට අධික කාලයක සිට එය යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 4.7 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) මිනිස් බල හා සංවර්ධන අංශය විසින් ඉටුකිරීමට සැලැසුම් කළ පහත සඳහන් කාර්යයන් කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි.

- මිනිස් බලය පුරෝකථනය කිරීම.
- ආංශික මිනිස් බල සැලැසුම් කිරීම.
- අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය මගින් සැලැසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

- මිනිස් බල සංවර්ධන සඳහා අදාළ ප්‍රතිපත්ති හා යෝජනා ක්‍රම සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

(ii) දෙපාර්තමේන්තුවේ දිගුකාලීන ඉලක්කවල අවධානයට ලක්වී තිබුණු කණ්ඩායම්, අබාධිත පුද්ගලයින් සහ ඌන සංවර්ධිත ප්‍රදේශවල වෙසෙන පුද්ගලයින් සඳහා ආශ්‍රිත පහසුකම් සැපයීම ඇතුළත්ව තිබුණද එම කාර්යයන් ඉටුකිරීම සඳහා වු ක්‍රියාකාරකම්, ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(iii) නිදහස් රැකියා සේවයක් ලබාදීමේ අරමුණින් දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමින් රැකියා පොළ වැඩසටහන් හා රැකියා සේවා වැඩසටහන් මගින් රැකියා ගත කිරීම් 10,000 ක් ඉලක්ක කර තිබුණ ද ඉන් සියයට 57 ක් හෙවත් 5,766 ක් ඉටුකර නොතිබුණි.

(iv) පාසැල් පදනම් කරගත් සමාජ ආර්ථික දත්ත අත්පොත වැඩසටහන සඳහා රු.200,000 ක ප්‍රතිපාදන ඉක්මවා රු.45,980 ක් වියදම් කර තිබුණද එහි භෞතික ප්‍රගතිය සියයට 80 ක් විය. එමෙන්ම හෝටල් කර්මාන්තය සඳහා වු රැකියා ප්‍රකාශනය (Publication of Job Profile Hotel Industry) සඳහා ප්‍රතිපාදන ඉක්මවා රු.170,025 ක් වියදම් කර තිබුණු අතර එය වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර නොතිබුණි.

## 4.8 අනාර්ථික ගනුදෙනු

වසර දෙකකට අධික කාලයක සිට ධාවනයෙන් ඉවත් කළ කැබ් රථයේ අළුත්වැඩියා කටයුතු, සේවා කටයුතු හා වෙනත් සේවාවන් ලබා ගැනීම වෙනුවෙන් රු.121,989 ක් 2014 වර්ෂයේදී වියදම් කර තිබුණි.

## 4.9 කළමනාකරණ දූර්වලතා

අදාල කාල සීමාවන් ඇතුළත පත්වීම් බලධාරියාගෙන් වැඩබැලීමේ කාලය දිර්ඝ කිරීමට අනුමැතිය ලබා ගැනීමකින් තොරව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනකු, අධ්‍යක්ෂ තනතුරුවල වැඩබැලිමටද, කළමනාකරණ සහකාර I ශ්‍රේණියේ නිලධාරියෙක් පරිපාලන නිලධාරි තනතුරෙහිද වැඩ බැලීමට පිළිවෙලින් 2014 අප්‍රේල් 01 දින, 2014 ඔක්තෝබර් 09 දින හා 2014 ජනවාරි 01 දින පත්කර තිබුණි.

## 4.10 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 10 | 3 |
| (ii) | තෘතියික මට්ටම | 2 | - | 2 |
| (iii) | ද්විතියික මට්ටම | 673 | 521 | 152 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 14 | 12 | 2 |
| | **එකතුව** | **702** | **543** | **159** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉහත සඳහන් තථ්‍ය කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් බව රාජ්‍ය පාරිපාලන අමාත්‍යාංශයට වාර්තා කර ඇති බව 2015 ජූලි 27 දින විගණනයට දන්වා තිබුණි.

(ii). ප්‍රධාන කාර්යාලයෙන් බැහැර නිලධාරීන්ගේ පැමිණීම, පිටවීම හා නිවාඩු සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම හා අධීක්ෂණ කටයුතු අදාල දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම්වරු විසින් සිදුකර තිබේද යන්න, පිළිබඳව කළමනාකරණය විසින් නිසි අධීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(iii). ප්‍රාදේශිය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කළ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති වාර්තා අනුව කාර්යාල 288 ක නිලධාරින්ට ලබා දුන් ඉලක්කයන්ට ළඟා නොවූ අවස්ථා 222 ක් තිබුණි.

(iv). ක්ෂේත්‍ර පරික්ෂා අධික්ෂණය දිස්ත්‍රික්/ප්‍රාදේශිය ලේකම් කාර්යාල 195 ක සිදුකර නොතිබුණු අතර පරීක්ෂාවන් සිදුකළ කාර්යාලවලට අදාල පරීක්ෂණ වාර්තා කිපයක් පමණක් ඉදිරිපත් කර තිබුණි.